ලබාගැනීමට තිබෙන හැකියාව, වගේම පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව, වත්කම් සහ භූගෝලීය පිහිටීම වැනි කාරණායි. සාර්ව සාධක යනු ආර්ථික වර්ධනය, ආංශික වර්ධනය, සේවා නියුක්තිය හා වියුක්තිය, උද්ධමනය, ගෙවුම් ශේෂය හා විශේෂයෙන් විනිමය අනුපාතිකය, රාජ්‍ය සුභසාධන වියදම් වගේ සාධකයි."

## 'ඉඩ ප්‍රස්ථා නොමැතිකම දරිද්‍රතාව සඳහා බලපාන ප්‍රධාන සාධකයයි'



**මහාචාර්ය සිරිමල් අබේරත්න - ආර්ථික විද්‍යා අංශය, කොළඹ විශ්වවිද්‍යාලය**

"දුගීබව ව්‍යාප්ත වීමට හේතු වශයෙන් ඉඩ ප්‍රස්ථා නොමැතිකම වගේම, හැකියාවන් නොමැතිකම හඳුනා ගැනෙනවා. එතකොට හැකියාවන් සහ ඉඩ ප්‍රස්ථා ඇති කිරීම සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් රජයට වගේම, ජනතාවටත් තිබෙනවා. මේ සාධක දෙකම තිබුණත්, දුප්පත්කම තිබීම සම්බන්ධයෙන් ආකල්ප වශයෙනුත් වැදගත්කමක් තිබෙනවා. මොකද සමහරවිට හැකියාවන් තිබෙන්න පුළුවන්, ඉඩ ප්‍රස්ථා තියෙන්නත් පුළුවන්, නමුත් සමහර අය තවදුරටත් දුප්පත්ව සිටීමට තෝරාගනීමක් කරනවා."

## 'දෙමවුපියන්ගෙන් දරුවන්ට දිළිඳුකම උරුම වන තත්ත්වයක් අප රටේ තිබෙනවා'



**මහාචාර්ය සේමසිංහ වන්නිනායක - ආර්ථික විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය**

"ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ ප්‍රාදේශීය ව්‍යාප්තිය පිළිබඳ සාකච්ඡාවේදී නාගරික අංශයේ අඩු දරිද්‍රතාවක් සහ ග්‍රාමීය හා වතු අංශවල දරිද්‍රතා ප්‍රතිශතය ඉහළ මට්ටමක් අප හඳුනාගනු ලබනවා. නාගරික අංශයේ පොදු පහසුකම්, යටිතල

කෘෂිකර්මාන්තය කේන්ද්‍ර කරගෙන තමයි, දිළිඳුකම පිටු දැකීමට උත්සහා කළේ. අභාග්‍යයකට වගේ නිදහසේ ඉඳලා අද දක්වා අපේ ප්‍රධාන අවධානය යොමුවන්නේත්, මේ කෘෂිකර්මාන්තය නගා සිටුවීම තුළින්ම දරිද්‍රතාව පිටු දැකිය යුතුයි කියන කාරණයටයි. කෘෂිකර්මාන්තය ඕනෑවට වඩා අවධාරණය කරලා, ඒ තුළින්ම දරිද්‍රතාව පිටු දැකීමට උත්සාහ කරනවා කියන්නේ, අපි තව තවත් දරිද්‍රතාවේ පතුලට කිඳ බැසීමකුයි."

## 'ආයෝජන අවමවීම දරිද්‍රතාව රට තුළ දිගින් දිගටම තිබීමට හේතුවක්'



**ආචාර්ය වසන්ත අතුකෝරළ - ආර්ථික විද්‍යා අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

"අන්තගාමී දේශගුණික, කාලගුණික තත්ත්වයන්, ඒ වගේම, රට තුළ ක්‍රියාත්මක වන යුදමය තත්ත්වයන්, දැඩි අසමානතාවක් රට තුළ ක්‍රියාත්මක වීම වැනි සාධකත් දරිද්‍රතාව කෙරෙහි දැඩිව බලපානවා. හැබැයි දැන් ඔය කියන සාධක ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව කෙරෙහි සෘජුව බලපාන තත්ත්වයක් මේ වනවිට පවතිනවා කියලා මා විශ්වාස කරන්නේ නැහැ. එයට හේතුව තමයි, බොහෝමයක් පර්යේෂණ මගින් පෙන්වා දී තිබෙන්නේ, ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවට බලපාන ඉහත සඳහන් සාධකවලට වඩා වෙනස් වූ සාධකයි.

පළමු වැනි සාධකය වන්නේ, ශ්‍රී ලංකාවේ මේ වනවිට පවත්නා අවස්ථා අවම මට්ටමක පැවතීම සහ පවතින අවස්ථා ප්‍රමාණවත් නොවීමයි. පුද්ගලයෙකුට තනියෙන් දියුණු වීමට, ඔවුන්ගේ හැකියාවෙන් දක්ෂතාවයෙන් නැගී සිටීමට අවශ්‍ය අවස්ථා මේ වනවිට රට තුළ නිර්මාණය වෙලා නැහැ. ඊළඟ කරුණ ලෙස රට තුළ ආයෝජනය සඳහා හොඳ තත්ත්වයක් නිර්මාණය වෙලා නැහැ. රට තුළ ආයෝජනය සඳහා ඇති අවදානම නිසා ආයෝජකයන් රට තුළ ආයෝජනයට පෙළඹෙන්නේ නැහැ. ඒ නිසා ග්‍රාමීය අංශයේ කෘෂිකර්මය හැර වෙනත් විකල්ප ආයෝජනයකට මිනිසුන් පෙළඹෙන්නේ නැහැ. ආයෝජනය අඩුවීම දරිද්‍රතාව දිගින් දිගටම රට තුළ පැවතීමට එක් ප්‍රධාන හේතුවක් ලෙස මා දකිනවා."

යුතු කාරණාවක්."

## 'සමාජයේ තිබෙන බෙදීම් දරිද්‍රතාව කෙරෙහි බලපානවා'



**ආචාර්ය නාලිනී හේන්නායක - භූගෝල විද්‍යා අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය**

"සමාජීය නිෂේධනය (Social exclusion) හරහාත් මේක වෙන්න පුළුවන්. උදාහරණයක් වශයෙන් මානව වර්ග ගත්තත්, කුලය කියන බෙදීම ගත්තත්, ඒ වගේම අපේ රටේ තරාතිරම කියන කාරණයට ඉතාමත්ම ප්‍රමුඛ වශයෙන් බෙදීම් තිබෙනවා. එහෙම නැත්නම්, අපි කොයිතරම් දුරට දේශපාලනඥයන් දැන හඳුනාගෙන සිටිනවාද කියන කාරණය, දේශපාලනඥයන්ට තියෙන දුර කියන කාරණයත් මං හිතන්නේ ඉතාමත්ම වැදගත් සාධකයක් වෙනවා. දරිද්‍රතාවට පිළියම් සෙවීමේදී දැන් මේ විවිධ කරුණු කරණා ඔස්සේ අවකාශීමය වශයෙන් සහ සමාජීය වශයෙන් නිෂේධනය වීමක්, ඈත් වීමක්, එහෙම නැත්නම් කොන් වීමක් සිදුවන බව අපි පැහැදිලිවම දකිනවා. අන්න ඒ කොන් වෙන, ඈත් වෙන කණ්ඩායමද, ශ්‍රී ලංකාවේ දුප්පත්ම කණ්ඩායම කියලා මට හිතෙනවා. මෙය බැරෑරුම් ප්‍රශ්නයක්."

පළාත් වශයෙන් ගත්විට අඩුම දරිද්‍රතා දර්ශකයක් බස්නාහිර පළාතෙන්ද, වැඩිම දරිද්‍රතා දර්ශකයක් උතුරු පළාතෙන්ද පෙන්නුම් කරන අතර, දුප්පත් ජනසංඛ්‍යාව අතින් පළමු වැනි තැනට මධ්‍යම පළාත පත්ව සිටියි. දිස්ත්‍රික්ක වශයෙන් ගත්විට දරිද්‍රතා දර්ශකය අඩුම දිස්ත්‍රික්කය කොළඹ දිස්ත්‍රික්කය වන අතර, වැඩිම දිස්ත්‍රික්කය කිලිනොච්චි දිස්ත්‍රික්කයයි. මෙම විද්වත් අදහස් සම්පිණ්ඩනය කිරීමේදී දුගීභාවයට බලපාන හේතු විවිධාකාර වන අතර, දුගීභාවය ඇති වීමේ අවදානමක් ඇති නවතම සාධක ලෙස පසුගිය වසර දෙක මුළුල්ලේ මෙරට ඇති වූ ගංවතුර, නියඟය හා නායයෑම් වැනි ස්වාභාවික සංසිද්ධීන්ද දැක්විය හැකිය. කෙසේ වෙතත්, 21 වැනි සියවස තුළ තිරසර සංවර්ධනය යනු සමස්ත ලෝකයේම, සාමාජීය සංවර්ධනයේද, ආර්ථික සංවර්ධනයේද, පරිසර ආරක්ෂණයේද සමතුලිතභාවය බව අප අමතක නොකළ යුතුය. වසර 2030 වනවිට මෙම ඉලක්ක පූර්ණ වශයෙන් සාක්ෂාත් කර ගැනීමට ශ්‍රී ලංකා රජයද අපේක්ෂා කරන්නේ ඒ නිසාය.